# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/9 - 2019 සැප්තැම්බර් මස 17 වැනි අඟහරුවාදා - 2019.09.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රා. ලේ. යොමු අංකය*: ELDS/LND/04/ACQ/2014-06.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2016/HA/284.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙපත්තුවේ කහවත්ත ග්‍රාම නිලධාරි වසමේ (189A) කහවත්ත නමැති ගමේ,

සැළැස්මේ අංකය:- අ. ග. පි. 58 අතිරේක 11, පත්‍ර අංක 12

**කැබලි අංක 232 - ඉඩමේ නම: ගහගාවවත්ත; ප්‍රමාණය : හෙක්ටයාර 0.0126.**

උතුරට: කැබලි අංක 9; නැගෙනහිරට: -; දකුණට: කැබලි අංක 9; බටහිරට: කැබලි අංක 9.

හිමිකම් කියන්නා: කෝණාර මුදියන්සේලාගේ සුබසිංහ, කහවත්ත, දඹුළුවන.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 දෙසැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.30ට ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 දෙසැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් සනාථ කිරීම සඳහා ලිපිලේඛන එදිනට මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

එස්. ඒ. දිල්රුක්,
ප්‍රාදේශීය ලේකම්,
ඇලපාත.

2019 සැප්තැම්බර් මස 12 වැනි දින
ඇලපාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-29

1A - G 30990 – 17 (2019/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*